සැ. යු. - 2013.09.13 වැනි දින පළවූ අංක 1828 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,829 - 2013 සැප්තැම්බර් මස 20 වැනි සිකුරාදා - 2013.09.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 822 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 824 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 825 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 ඔක්තෝබර් මස 11 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 සැප්තැම්බර් මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2013 අංක 287

MOD/DEF/02/01/ARF/RET/336.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරියා 2012 දෙසැම්බර් මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

මේජර් හේනේගම ඉලගොල්ල හසිත සිරිවර්ධන, ශ්‍රීලසසබ (නි/62780)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

09-704

---

2013 අංක 288

MOD/DEF/2/01/ARF/RET/331.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරියා 2013 ජනවාරි මස 05 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතාන් තේන්නකෝන් හේරත් මුදියන්සේලාගේ ඕෂදී සේනාරත්න, ශ්‍රීලකාහ (නි/63861)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

09-703

---

2013 අංක 289

MOD/DEF/2/01/ARF/RES/333.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරී 2013 අප්‍රේල් මස 30 වැනි දින සිට අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතාන් වරුෂහැන්නැදිගේ ෂාමික ප්‍රසාද් සොයිසා, ශ්‍රීලංසංබ (නි/67102)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

09-702

---

2013 අංක 290

MOD/DEF/2/01/ARF/RES/329.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරී 2012 නොවැම්බර් මස 14 වැනි දින සිට අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

ලුතිනන් රොමේෂ් ටෙරන්ස් ජයසුන්දරම්, ශ්‍රීලයුවෙබ (නි/68997)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

09-705

2013 අංක 291

MOD/DEF/2/01/ARF/RET/332.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරියා 2012 දෙසැම්බර් මස 12 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

දෙවන ලුතිතන් දිසානායක මුදියන්සේලාගේ ගාමිණී දිසානායක, ශ්‍රීලංසිරෙ (නි/67184)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

09-706

2013 අංක 292

D/AF/718.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද නිත්‍ය උප සේවයට මාරු කිරීමක්

2009 සැප්තැම්බර් මස 17 වැනි දින පහත නම සඳහන් නිලධාරියා නිත්‍ය ගුවන් හමුදා සේවයේ සිට නිත්‍ය උප සේවයට මාරු කරන ලදී :

එයාර් වයිස් මාර්ෂල් ඉලංගරත්න ප්‍රේමනාත් බුද්ධිවිමල ලියනගේ (01285) - කාර්මික/ඉංජි

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 ජූලි මස 01 වැනි දින,
කොළඹ දී ය.

09-475/1

---

2013 අංක 293

D/AF/718.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2009 සැප්තැම්බර් මස 17 වැනි දින පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත :

එයාර් වයිස් මාර්ෂල් ඉලංගරත්න ප්‍රේමනාත් බුද්ධිවිමල ලියනගේ (01285) - කාර්මික/ඉංජි

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 ජූලි මස 01 වැනි දින,
කොළඹ දී ය.

09-475/2

# රජයේ නිවේදන

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/29/2013/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2013.09.20 වැනි දින සිට 2013.10.04 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම් කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2013.10.11 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

*උපලේඛනය*

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් දරන කොට්ඨාසයේ 2861 වෙළුමේ 54 පත්‍රිරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළයේ ශ්‍රී ජයවර්ධනපුර මහ නගර සභා සීමාව තුළ නාවල, දෙවන පටුමගෙහි පිහිටි "දෙල්ගහවත්ත" නමැති ඉඩමේ කැබලි අංක 01ට ජේ. ඒ. ඩබ්. කාවල්හෝ මානක තැන විසින් 2005.02.15 දින මැන සාදන ලද අංක 5481 දරන ඉඩමට ප්‍රකාර මායිම්,<br><br>*උතුරට* : එන්. සී. ඩයස්ගේ දේපළ<br>*නැගෙනහිරට* : ආර්. ප්‍රනාන්දුගේ දේපළ<br>*දකුණට* : ලොට් 4, 2<br>*බස්නාහිරට* : පී. ඒ. පෙරේරාගේ දේපළ<br><br>ප්‍රමාණය : අ. 00, රූ. 00, පර්. 2.50 | ඒ. එම්. ඒ. අත්තනායක ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 2005.05.17 වැනි දින අංක 2288 දරන තෑගි ඔප්පුව |

09-701

---

**1971 අංක 52 දරන වෙළඳ නැව් පනත**

2006 අංක 01 දරන වෙළඳ නැව් ලියාපදිංචි කිරීමේ නියෝගයේ 5 වැනි වගන්තිය යටතේ II වැනි උපලේඛනයට නව සමාගමක් ඇතුළත් කිරීම දැනුම් දීම

2006.10.31 වැනි දින අංක 1469/22 දරන *විශේෂ ගැසට් පත්‍රයෙන්* යථා පරිදි කරන ලද, 2006 අංක 01 දරන වෙළඳ නැව් (ලියාපදිංචි කිරීම) නියෝගයේ 5 වැනි වගන්තිය යටතේ, මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව ඇමරිකා එක්සත් ජනපදයේ මියාමි ෆ්ලොරිඩාහි ස්ථාපිත, ඉන්ටර්නැෂනල් රෙජිස්ටාර් ඔෆ් ෂිපින් (IRS) සමාගම, වර්ගීකරණ සමාගමක් ලෙස 2013.09.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එක් වසරක පරිවාස කාලයට යටත්ව, වෙළඳ නැව් (ලියාපදිංචි කිරීමේ) නියෝගයේ II උපලේඛනයට ඇතුළත් කළ බව දන්වමි. ඒ අනුව සංශෝධිත II උපලේඛනය පහත පරිදි වේ.

ඒ. ඩබ්ලිව්. සෙනෙවිරත්න,
වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්.

II වැනි උපලේඛනය

*වර්ගීකරණ සංගම් ලැයිස්තුව :*

1. ඇමරිකන් බියුරෝ ඔෆ් ෂිපින්
2. බියුරෝ වෙරිටාස්
3. චයිනා ක්ලැසිපිකේෂන් සොසයිටි
4. ඩෙට් නොර්ස්කි වෙරිටාස්
5. ජර්මනිෂ්චර් ලොයිඩ්
6. කොරියන් රෙජිස්ටර් ඔෆ් ෂිපින්
7. ලොයිඩ් රෙජිස්ටර්
8. නිපෝන් කායිජි කියොකායි
9. රෙජිස්ට්‍රෝ ඉටාලියානෝ නේවල්
10. රෂියන් මැරිටයිම් රෙජිස්ටර් ඔෆ් ෂිපින්
11. ඉන්ඩියන් රෙජිස්ටර් ඔෆ් ෂිපින්
12. ඉන්ටර්නැෂනල් රෙජිස්ටර් ඔෆ් ෂිපින්

09-933

---

**ජාතික සත්වෝද්‍යාන පනත**

1982 අංක 41 දරන ජාතික සත්වෝද්‍යාන පනතේ 8 වන වගන්තිය යටතේ සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදල පිහිටුවා ඇති අතර දෙහිවල සත්වෝද්‍යානය හා පින්නවල අලි අනාථාගාරය නැරඹීමේ ප්‍රවේශ පත්‍ර ගාස්තු එකී අරමුදලට බැර කරනු ලබයි. 2013.10.01 දින සිට ඇතුළුවීමේ ගාස්තු සංශෝධනය කරනු ලැබේ.

ආචාර්ය ඩබ්ලිව්. විලී ගමගේ,
ලේකම්,
උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය,

2013 අගෝස්තු මස 23 වැනි දින.

**නියෝග**

2013.10.01 වැනි දින සිට දෙහිවල සත්වෝද්‍යානය හා පින්නවල අලි අනාථාගාරය නැරඹීම සඳහා පැමිණෙන විදේශීය නරඹන්නන්ගෙන් අයකරනු ලබන ප්‍රවේශ පත්‍ර ගාස්තු පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

| *ප්‍රවේශ පත්‍ර වර්ගය* | *ගාස්තුව රු.* |
|---|---|
| විදේශීය වැඩිහිටි (සාර්ක් රටවල් හැර) | 2,500 |
| විදේශීය ළමා (සාර්ක් රටවල් හැර) | 1,250 |
| විදේශීය වැඩිහිටි (සාර්ක් රටවල්) | 700 |
| විදේශීය ළමා (සාර්ක් රටවල්) | 350 |

** අර්ථ නිරූපනය

වැඩිහිටි - වයස අවුරුදු 12 ට වැඩි ළමුන් ඇතුළු සියළු පුද්ගලයින්
ළමා - වයස අවුරුදු 12 ට අඩු

09-409

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - බොගවන්තලාව ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය

පරමසිවම් තවවෙල්වන් සහ ඇන්ඩ් සීන්නසාමි පරමසීවම් නොහොත් සීන්නසාමි පරමසීවම්

2013 ජූලි මස 31 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දා වූ ද 2012 මාර්තු මස 20 වැනි දින සහතික කළ අංක 2729 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පරමසීවම් තවවෙල්වන් සහ ඇන්ඩ් සීන්නසාමි පරමසීවම් නොහොත් සීන්නසාමි පරමසීවම් යන අය ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පනස්තුන්ලක්ෂ විසිපන්දාස් හාරසීයහතයි ශත හැටඑක (රු.5,325,407.61) ක මුදලක් 2013 මැයි 31 වන දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රු. 5,325,407.61 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2013 ජූනි 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩුකොට එකී අංක 2729 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූද, දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ මහනුවර ආදායම් දිස්ත්‍රික්කයේ ගම්පල දිස්ත්‍රික්කයේ, ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ අඹගමුව කෝරළේ උඩබුලත්ගම කොට්ඨාසයේ බොගවන්තලාවේ පිහිටි වරිපනම් අංක 18 (කලින් වරිපනම් අංක 59) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඩී. ස්මිත් 1954 නොවැම්බර් 14 වන දින මැන සාදන ලද අංක 542 දරන පිඹුරෙන් බෙදා වෙන් කල ලොට් 11 කේ වශයෙන් හැඳින්වෙන ඉඩම් කොටස වන උතුරට: ලොට් 11 එල් ද, නැගෙනහිරට : සුසාන භූමිය ද, දකුණට : ලොට් 11 ජේ සහ බස්නාහිරට : වතු පාරද යන මායිම් තුළ ඉහත කී පිඹුර ප්‍රකාරව පර්චස් තුනයි දශම බිංදුවයි නමය (අ. 0, රූ. 0, පර්. 3.09) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වන මෙය ගම්පොළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව බී 845/141 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් ඉඩම මෑතකදී කරන ලද මැනීමකින් පසු පහත සඳහන් පරිදි විස්තර කෙරේ :-

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ දැන් නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගම්පල ලියාපදිංචි දිස්ත්‍රික්කයේ අඹගමුව කෝරළයේ අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඹගමුව ප්‍රාදේශීය සභා සීමාවේ බොගවන්තලාව පන්සල පාරේ බොගවන්තලාව නගරයේ පිහිටි වරිපනම් අංක 18 නැමති

ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් 2012 පෙබරවාරි 07 වැනි දින මැන සාදන ලද අංක 14350 දරන පිඹුරෙන් බෙදා වෙන් කල ලොට් 1 වශයෙන් හැඳින්වෙන ඉඩම් කොටස වන උතුරට: පන්සල පාර සහ පන්සල පාරේ වරිපනම් අංක 20 දරන පරශ්‍රය ද, නැගෙනහිරට : පන්සල පාරේ වරිපනම් අංක 16, 20 සහ ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම ද, දකුණට : පන්සල පාරේ වරිපනම් අංක 16 දරන පරිශ්‍රය සහ පන්සල පාර සහ බස්නාහිරට : පන්සල පාරේ වරිපනම් අංක 16 සහ පන්සල පාර යන මායිම් තුළ ඉහත කී පිඹුර ප්‍රකාරව පර්චස් තුනයි දශම බිංදුවයි හතර (අ. 0, රූ. 0, පර්. 3.04) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09-861/1

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - රාගම ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

වයි. කේ. ෆුඩ්ස් මාකටින් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2013 ජූලි මස 31 වන දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එල්. ඒ. ඩී. ගුණතිලක විසින් 2011 මාර්තු 29 වන දින සහතික කළ අංක 2311 දරන උකස් බැඳුම්කරය මගින් වයි. කේ. ෆුඩ්ස් මාකටින් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් හා සෙනෙවිරත්න ප්‍රියන්ත නොර්ටන් හෙවත් ප්‍රියන්ත නොර්ටන් සෙනෙවිරත්න උකස්කරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් ලබා ගත් ණය මුදල් සඳහා සුරකුම් වශයෙන් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති වයි. කේ. ෆුඩ්ස් මාකටින් (ප්‍රයිවට්) ලිමිටඩ් සඳහා ප්‍රධානය කරන ලද ණය මුදල් වෙනුවෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇති හෙයින් ද,

සෙනෙවිරත්න ප්‍රියන්ත නොර්ටන් හෙවත් ප්‍රියන්ත නොර්ටන් සෙනෙවිරත්න යන අය වයි. කේ. ෆුඩ්ස් මාකටින් (ප්‍රයිවට්) ලිමිටඩ් සතු සියලුම කොටස්වල පාහේ හිමිකාරිත්වය දරන බැවිනුත් වයි. කේ. ෆුඩ්ස් මාකටින් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ කොටස්කරුවෙකු වශයෙන් එම සමාගමේ පාලනය හා කළමණාකරණ කටයුතු වල යෙදී සිටින බැවිනුත් සෙනෙවිරත්න ප්‍රියන්ත නොර්ටන් හෙවත් ප්‍රියන්ත නොර්ටන් සෙනෙවිරත්න යන අය වයි. කේ. ෆුඩ්ස් මාකටින් (ප්‍රයිවට්) ලිමිටඩ් හි සියලු මෙහෙයුම් කටයුතු කරන බැවිනුත් ඔහු එහි නියම අයිතිකරු වන බැවිනුත් වයි. කේ. ෆුඩ්ස් මාකටින් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් සලසන ලද මූල්‍ය පහසුකම් වල නියම අර්ථලාභියා වනුයේ එකී සෙනෙවිරත්න ප්‍රියන්ත නොර්ටන් හෙවත් ප්‍රියන්ත නොර්ටන් සෙනෙවිරත්න වන බැවිනුත්,

වයි. කේ. ෆුඩ්ස් මාකටින් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ සෙනෙවිරත්න ප්‍රියන්ත නොර්ටන් හෙවත් ප්‍රියන්ත නොර්ටන් සෙනෙවිරත්න යන අය හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල ගෙවීම පැහැර හැර ඇති හෙයින්ද 2013 මාර්තු 31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත රුපියල් හැටඑක්ලක්ෂ දෙදාහස් එකසිය අනූඅටයි ශත පනස්පහක් (රු. 61,02,198.55) අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රු. 61,02,198.55 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2013 අප්‍රේල් 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද සමග ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුලුව තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා අංක 2311, දරන උකස් බැඳුම්කර යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇති දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ (නමුත් කොළඹ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ) සියනෑ කෝරළේ අධිකාරී පත්තුවේ බියගම ප්‍රාදේශීය සභා සීමාවේ ගල්ඊදන්ඩ සහ ගෝනවල ග්‍රාමයේ පිහිටි බතලවත්ත එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. සී. එම්. එස්. විමලරත්න විසින් 1997 ඔක්තෝබර් 16 දින මැන සාදන ලද අංක 231/1997 හි ලොට් ඒ වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් 1964 මැයි 19 දින සාදන ලද පිඹුරු අංක 990 හි ලොට් 54 ද, නැගෙනහිරට : පිඹුරු අංක 990 දැක්වෙන ලොට් 86 (පාර) ද, දකුණට : පිඹුරු අංක 990 හි ලොට් 92 (පාර) සහ බස්නාහිරට : පිඹුරු අංක 990 හි ලොට් 71 ඉතිරි කොටසට මායිම් වූ අංක 231/1997 දරන පිඹුර ප්‍රකාරව පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) වේ.

බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් 1964 මැයි 19 වැනි දින සාදන ලද පිඹුරු අංක 990 හි පාරක් සඳහා වෙන්කොට ඇති බිම් කොටස මතින් ගමන් කිරීමේ ප්‍රවේශ අයිතිය සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09-861/2

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - අලුත්ගම ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ලොකුකන්කානම්ගේ ජනිත රංගජීව පීරිස්

2013 ජූලි මස 31 වැනි පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්ලිව් පෙරේරා විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට

ලියන ලද්දාවූ ද 2005 අප්‍රේල් 25 වැනි දින සහතික කළ අංක 1290, 2006 අගෝස්තු 17 වැනි දින සහතික කළ අංක 1666, 2010 සැප්තැම්බර් 09 දින සහතික කළ අංක 3179 සහ 2011 ඔක්තෝබර් 25 වැනි දින සහතික කළ අංක 3655 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලොකුකන්කානම්ගේ ජනිත රංගජීව පීරිස් යන අය ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැත්තෑතුන්ලක්ෂ තිස්එක් දහස් අසූහයයි ශත පනස් දෙක (රු. 7,331,086.52) ක මුදලක් 2013 මැයි 31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රු. 7,331,086.52 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2013 ජුනි 01 වන දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 1290, 1666, 3179 සහ 3655 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩී. කේලාට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ කළුතර දකුණ තොටමුණේ අළුත්ගම බැද්දේ බේරුවල ප්‍රාදේශීය සභාවේ අළුත්ගම උපකාර්යාල සීමාව තුළ ගනේගම පිහිටි වෙල්ලබොඩවත්තේ කොටස නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එල්. ඩබ්ලිව් පෙරේරා 2000 ඔක්තෝබර් 07 වැනි දින මැන සාදන ලද අංක 1896 දරන පිඹුරෙන් බෙදා වෙන්කල ලොට් ඒ 1 ඉඩමට මායිම් උතුරට : ඩබ්ලිව්. චාලට් ප්‍රනාන්දු සහ තවත් අය විසින් හිමිකම් කියන එම ඉඩමේම කොටසක් ද, නැගෙනහිර : ගඟබොඩ පාර ද, දකුණට : ලොට් ඒ 2 සහ බස්නාහිරට : බෙන්තොට ගඟද මායිම් වූ අංක 1896 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දොළහයි දශම බිංදුවයි එක (අ. 0, රූ. 0, පර්. 12.01) ක් විශාලත්වයෙන් වූ ඉඩම සහ ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වන මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච්. 231/233 යටතේ ලියාපදිංචි කර ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09-861/3

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - අලුත්ගම ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

සිංහාර ජගත් නිලන්ත සිල්වා සහ අන්තෝනිදූර මංජුලා නිශාන්ති සිල්වා.

2013 ජූලි මස 31 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්ලිව් පෙරේරා විසින් සහතික කරන ලද්දා වූද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූද 2012 මැයි 25 දින අංක 3921 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සිංහාර ජගත් නිලන්ත සිල්වා සහ අන්තෝනි දූර මංජුලා නිශාන්ති සිල්වා ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැත්තෑතුන්ලක්ෂ අනූදෙදාහස් පන්සිය අසූවයි ශත අසූව (රු.7,392,580.80) ක මුදලක් 2013 මැයි 08 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින්ද එකී රු. 7,392,580.80 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2013 මැයි 09 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 3921 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස්කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද දේපල හා පරිශ්‍ර කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩී. කේලාට් මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

1 බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුණ දකුණ අලුත්ගම්බැද්දේ බේරුවල ප්‍රාදේශීය සභාවේ මාලේවන් බැද්ද උප කාර්යාල සීමාවේ කළුවාමෝදර හි පිහිටි කාලවිල වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එල්. ඩබ්ලිව්. පෙරේරා විසින් පිළියෙල කරන ලද 1989 නොවැම්බර් 10 දිනැති අංක 914 දරන පිඹුරෙන් බෙදා වෙන්කොට ඇති ලොට් 9ඒ වශයෙන් දැක්වෙන ඉඩම් කොටස වන උතුරට : ඩබ්ලිව්. එම්. මෙන්ඩිස් ඩිස්ටිලරි හි පරිශ්‍රයෙන් ද සහ ලොට් 9 බී වලින් ද, නැගෙනහිරට: ලොට් 9 බී සහ පාර ද, දකුණට : පාර සහ එම ඉඩමේම ලොට් 1 සහ 2 සහ බස්නාහිරට : එම ඉඩමේම ලොට් 1, 2 සහ ඩබ්ලිව්. එම්. මෙන්ඩිස් ඩිස්ටිලරි හි පරිශ්‍රයෙන්ද මායිම් වූ එකී අංක 914 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20) ක විශාලත්වයෙන් යුත් ඉඩම වන, මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 244/70 යටතේ ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුණ දකුණ අලුත්ගම්බැද්දේ බේරුවල ප්‍රාදේශීය සභාවේ මාලේවන් බැද්ද උප කාර්යාල සීමාවේ කළුවාමෝදර හි පිහිටි කාලවිල වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එල්. ඩබ්ලිව්. පෙරේරා විසින් පිළියෙල කරන ලද 1999 නොවැම්බර් මස 10 දිනැති අංක 914 දරන පිඹුරෙන් බෙදා වෙන් කොට ඇති ලොට් 9 බී වශයෙන් දැක්වෙන ඉඩම් කොටස වන උතුරට : ඩබ්ලිව්. එම්. මෙන්ඩිස් ඩිස්ටිලරි හි පරිශ්‍රයෙන් ද, නැගෙනහිරට : කළුවාමෝදර ගඟ ද, දකුණට : එම ඉඩමේම ලොට් 11 සහ බස්නාහිරට : පාර සහ පිඹුරු අංක 914 ලොට් 9 ඒ මායිම් වූ එකී අංක 914 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20) ක විශාලත්වයෙන් යුත් ඉඩම වන, මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 258/287 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු ජී. එල්. ඩබ්ලිව්. පෙරේරා විසින් 1989 දෙසැම්බර් 11 දින සාදන ලද පිඹුරු අංක 914 හි දැක්වෙන අඩි 15 ක් පළල පාරේ මාර්ග අයිතිය සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09-861/4

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - තිස්සමහාරාම ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ඌරපොල මුදලිගේ නිහාල්.

2013 ජූලි මස 31 වැනි පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

අම්බලන්තොට ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඒ. අමරසේන විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දා වූ ද 2012 නොවැම්බර් 14 වැනි දින සහතික කළ අංක 13186 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඌරපොල මුදලිගේ නිහාල් යන අය ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පනස්තුන්ලක්ෂ දහතුන්දහස් දෙසීය හැත්තෑහතයි ශත විසිදෙකයි (රු. 5,313,277.22) ක මුදලක් 2013 මාර්තු 31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින්ද එකී රු. 5,313,277.22 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2013 අප්‍රේල් 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 13186 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූද දේපළ හා පරිශ්‍ර කොළඹ බලයලත් වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

#### උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම් පත්තුවේ, තිස්සමහාරාමයේ කාසිංගම පිහිටි බංගලාවත්ත නොහොත් පාරුවතී අම්මා පදිංචිවත්ත නොහොත් පහේකණුවත්ත කැබැල්ල (ඉඩම හරහා ඇති වාරිමාර්ග ඇලහැර) නමැති ඉඩමට බලයලත් මිනින්දෝ පී. අයියදොරේ විසින් 1963 සැප්තැම්බර් 28 වැනි දින මැන සාදන ලද අංක 502 (පත්‍රිරු 11) දරන ඉඩමට මායිම් උතුරට නැගෙනහිරට සහ දකුණට : එම්. එස්. තම්බිරාජා සහ තවත් අයට අයිති ඉඩම සහ බස්නාහිරට : ප්‍රධාන පාර සහ එම්. එස්. තම්බිරාජා හා තවත් අයට අයිති ඉඩමට මායිම් වූ රුඩ් දෙකක් වන (අ. 0, රූ. 2, පර්. 0) විශාල ඉඩම ගොඩනැගිලි සහ සියලුදේත් සමග වේ. මෙම ඉඩම හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්‍රිරු ඒ 1199/1998 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් ඉඩම මෑතකදී සාදන ලද පිඹුරේ පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම් පත්තුවේ, තිස්සමහාරාමයේ කාසිංගම පිහිටි බංගලාවත්ත නොහොත් පාරුවතී අම්මා පදිංචිවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. ඒ. පාලිත විසින් 2013 අප්‍රේල් 29 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක එච්ජ්/80 දරන ඉඩමට මායිම් උතුරට නැගෙනහිරට සහ දකුණට : එච්. එස්. තම්බිරාජා සහ තවත් අයට අයිති ඉඩම සහ බස්නාහිරට : ප්‍රධාන පාර සහ එම්. එස්. තම්බිරාජා හා තවත් අයට අයිති ඉඩමට මායිම් වූ රූඩ් දෙකක් වන (අ. 0, රූ. 2, පර්. 0) විශාල ඉඩම සහ ගොඩනැගිලි සහ සියලු දේත් සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09-861/5

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී . - වත්තල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය

ප්‍රබෝධ කේෂන සුමණසේකර.

2013 ජූලි මස 31 වැනි පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ලඩය රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ආර්. ෆායිස් විසින් 2009 මැයි 25 වැනි දින සහිතක කළ අංක 627 දරන උකස් බැඳුම්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් 2010 ඔක්තෝබර් 28 වැනි දින සහතික කළ අංක 4452 යන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ප්‍රබෝධ කේෂන සුමණසේකර ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් හතරකෝටි හතලිස්නවලක්ෂ හතලිස්හතරදහස් හයසිය තිස්දෙකයි ශත හැත්තෑව (රු.44,944,632.70) ක මුදලක් 2013 ජුනි 04 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 44,944,632.70 ක මුදල අයකර ගැනීම සඳහා 2013 ජුනි 05 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 627 හා 4452 (කොටසක්) දරන බැඳුම්කරයන් යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩී. කේලාට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහනගර සභා සීමාවේ, කොට්ඨාස අංක 37 කොල්ලුපිටියේ, ආනන්ද කුමාරස්සාමි මාවතේ, වරිපනම් අංක 68 (කොටසක්) වන "බෘස් හිල්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එච්. සුබසිංහල 2007 නොවැම්බර් 01 වැනි දින මැන සාදන ලද අවසාන බෙදා වෙන්කිරීමේ අංක 2507 දරන පිඹුරෙන් බෙදා වෙන් කල ලොට් 1 ඒ වශයෙන් හැඳින්වෙන ඉඩම් කොටස වන උතුරටː ලොට් 1 බී ද, නැගෙනහිරට : ආනන්ද කුමාරස්සාමි මාවතේ වරිපනම්

අංක 70 ද, දකුණට : ආනන්ද කුමාරස්සාමි මාවතේ පරිපනම් අංක 68/4 සහ බස්නාහිරට : පුද්ගලික පාරට මායිම් වූ අංක 2507 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විස්සයි දශම හතරයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 20.40) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

මෙම ඉඩම මෑතකදී කරන ලද මැනීමකින් අනතුරුව පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සභා සීමාවේ, කොට්ඨාස අංක 37 කොල්ලුපිටියේ, ආනන්ද කුමාරස්සාමි මාවතේ වරිපනම් අංක 68 (කොටසක්) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එච්. සුබසිංහ 2009 අප්‍රේල් 29 වැනි දින මැන සාදන ලද අංක 2657 දරන පිඹුරෙන් බෙදා වෙන්කල ලොට් 1 වශයෙන් හැඳින්වෙන ඉඩම් කොටස වන උතුරට : ලොට් 2 ද, නැගෙනහිරට : ආන්නද කුමාරස්සාමි මාවතේ වරිපනම් අංක 70 දරන පරිශ්‍රය ද, දකුණට : ආනන්ද කුමාරස්සාමි මාවතේ වරිපනම් අංක 68/4 දරන පරිශ්‍රය සහ බස්නාහිරට : පුද්ගලික පාරට මායිම් වූ අංක 2657 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විස්සයි දශම හතරයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 20.40) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

බලයලත් මිනින්දෝරු එච්. එච්. සුබසිංහ විසින් සාදන ලද පිඹුරු අංක 2507 හි ලොට් 1 වශයෙන් දැක්වෙන කැබැල්ලේ බටහිර මායිම ඔස්සේ ග්‍රීන්පාත් (දැන් ආනන්ද කුමාරස්වසාමි මාවත) පාරේ සිට අඩි 20 ක් පළල මාර්ගය පරිහරන අයිතිය සමග.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09-861/6

---

**මහජන බැංකුව - ලකී ප්ලාසා**

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013.07.10 වැනි දින පවත්වන ලද ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ.

මහජන බැංකුව වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. එන්. ප්‍රේමදාස මහත්මිය විසින් සහතික කල 2012.04.26 වැනි දින අංක 1180 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම "සමන් එන්ටර්ප්‍රයිසස්" යන නාමය හා අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන සමන් ජයවිලාල් සමරතුංග සහ පොල්වත්ත ගමගේ ප්‍රියංගනී රේණුකා යන අය විසින් පැහැරහැර ඇති හෙයින්ද, එකී අංක 1180 දරන උකස් බැඳුම්කරය මත දැනට මහජන බැංකුව වෙත රු. 15,521,321.90 (රුපියල් මිලියන පහළවයි පන්ලක්ෂ විසි එක් දහසී තුන්සිය විසි එකයි ශත අනූවක්) වූ මුදලක් ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, අනතුරුව කිසියම් ගෙවීමක් සිදුකර (ඇත්නම්) එම මුදල අඩුකිරීමෙන් පසුව සහ වෙනත් විකුණුම් පිරිවැය සහ ගාස්තු ද සමග රු. 15,000,000 (රුපියල් මිලියන පහළවක් පමණක්) වූ මුදලක් මත 2013.06.01 වැනි දින සිට වෙන්දේසි දිනය දක්වා වර්ෂයකට 22% වූ තවදුරටත්වූ පොලිය ද සමග රු. 15,521,321.90 (රුපියල් මිලියන පහළවයි පන්ලක්ෂ විසි එක් දහස් තුන්සිය විසි එකයි ශත අනූවක්) වූ මුදලක් අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1180 දරන උකස් බැඳුම්කරය මගින් මහජන බැංකුව වෙත උකස් කරන ලද දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර අර්වින් පෙරේරා මහතා මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මතකර සිටිනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරී පත්තුවේ, තල්වත්ත පිහිටා ඇත්තාවූ ද, "අට්ටික්කාගහවත්ත" "කැටකෑල්ලගහවත්ත" 'මාදින්නා වත්ත" සහ "ජම්බුගහවත්ත" යනුවෙන් හැඳින්වෙන ඉඩම් සඳහා බලයලත් මිනින්දෝරු ඩබ්. ජී. සුනිල් සෝමසිරි විසින් සාදන ලද 2011.03.13 වැනි දින අංක 886 දරන පිඹුරේ නිශ්චිතව දක්වා ඇති "ලොට් 1" යනුවෙන් ලකුණු කර ඇත්තාවූ උතුරට : බියගම මාර්ගය ද, නැගෙනහිරට : පී. කරුණාරත්න සහ එස්. පෙරේරා යන අය විසින් භුක්ති විඳිනු ලබන ඉඩම ද, දකුණට : මාර්ගය ද, බටහිරට : මාර්ගය ද, යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ C762/114 යටතේ ලියාපදිංචි වී ඇති එකී අංක 886 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් දාසයයි දශම නවයයි එකක් වූ (අ. 0, රූ. 0, පර්. 16.91) එකී ලොට් අංක 1 දරන බෙදා වෙන් කල ඉඩම හා ඒ තුළ වූ ගොඩනැගිලි සහ වෙනත් සියලු දේද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

කලාප කළමණාකරු,
(කොළඹ දකුණ).

මහජන බැංකු කලාප ප්‍රධාන කාර්යාලය,
(බස්නාහිර කලාපය 01),
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

09-859

---

**නේෂන් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ නේෂන් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013 ජූලි මස 31 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සුමිත් කොයර් ෆයිබර් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. කලන්සූරිය විසින් සහතික කරන ලද අංක 1263 සහ 2010 සැප්තැම්බර් මස 24 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය, "සුමිත් කොයර් ෆයිබර් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්" විසින් ලබාගත් මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා කොළඹ 02, යූනියන් පෙදෙසේ, අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී වෙත සුරක්ෂිතයක් වශයෙන් එකී සුමිත් කොයර් ෆයිබර් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, ඉහත කී උකස් බැඳුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් ගෙවා පියවා දැමීම එකී සුමිත් කොයර් ෆයිබර් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පැහැර හැරීම සිදුකර ඇති බැවින් ද,

ඇසුරුම් ණය පහසුකම් මත රුපියල් එක්කෝටි තුන්ලක්ෂ හතළිස් හය දහස් නවසිය විසිඑකකුත් ශත අසූඅටක (රුපියල් 10,346,921.88) මුදල සහ 2013 අප්‍රේල් මස 30 වැනි දිනට රුපියල් හැත්තෑනවලක්ෂ අනූපන්දහසක (රුපියල් 7,995,000) මුදල මත එකඟ වූ පරිදි 2013 මැයි මස 01 වැනි දා සිට තවදුරටත් උපචිත පොළිය ද, 2013 අප්‍රේල් මස 30 වැනි දිනට හිඟ අයිරා පහසුකම වන රුපියල් දහහතරලක්ෂ හතළිස් අට දහස් දෙසිය හතළිස් පහකුත් ශත විසිඑකක (රුපියල් 1,448,245.21) මුදල සහ ඒ මත එකඟ වූ පරිදි 2013 මැයි මස 01 වනදා සිට තවදුරටත් උපචිත පොළිය ද, ඊට සම්බන්ධ අනෙකුත් ව්‍යවස්ථාපිත අයකිරීම් සහ ප්‍රචාරක වියදම් ද, තදනන්තරව ගෙවා ඇති මුදලක් (වේතොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ, ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් හි ත්‍රිවංක සී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

උතුරු පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මදුරන්කුලිය ගමේ මානකුඹුක්කඩුවල පාරේ පිහිටි, උණාවේඑකානි හෙවත් පත්තයම් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ඕ. එම්. නජීබ් විසින් මැන සාදන ලද අංක 2511 සහ 2010 අප්‍රේල් මස 08 වැනි දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 1 ට මායිම්, උතුරට : ෂෙල්ටන් හිමිකම් කියන ඉඩම සහ මහකුඹුක්කඩවල පාර ද, නැගෙනහිරට : සීනුල් අබ්දීන් සහ කෙමිලස් හිමිකම් කියන ඉඩම ද, දකුණට : කෙමිලස් හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට : වික්ටර් සහ ෂෙල්ටන් හිමිකම් කියන ඉඩම සහ බලයලත් මිනින්දෝරු ආර්. කනගරත්නම් විසින් මැන සාදන ලද අංක 6635 සහ 1996 අගෝස්තු මස 18 වැනි දින දරන පිඹුරේ කැබලි අංක 1 ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 2511 දරන පිඹුර අනුව අක්කර දෙකක් (අ. 02, රූ. 0, පර්. 0) විශාල ඉඩම සහ ඊට අයිති ගහකොළ පලතුරු ආදී සෑම සියලු දේත් සමග ය.

ඉහත කී අංක 2511 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 1 වනාහි අංක 260/A/6 දරන පිඹුරේ නිරූපිත පහතින් සවිස්තරව දක්වා ඇති කැබලි අංක 1 හි නැවත මැන බෙදීමක් වෙයි.

උතුරු පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම දකුණු පත්තුවේ, මදුරන්කුලිය ගමේ පිහිටි, උණාවේඑකානි හෙවත් පත්තයම් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ඒ. වී. රාජනායගම් මහතා විසින් මැන සාදන ලද අංක 260/A/6 දරන සහ 2005 ජූලි මස 25 වැනි දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 1 ට මායිම්, උතුරට : පාර සහ අඩි පාර ද, නැගෙනහිරට: සීනුල් අබ්දීන් හිමිකම් කියන ඉඩම ද, දකුණට : කෙමිලස් හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට : අඩි පාර, නන්දනී හිමිකම් කියන ඉඩම සහ බලයලත් මිනින්දෝරු ආර්. කනගරත්නම් විසින් මැන සාදන ලද අංක 6635 සහ 1996 අගෝස්තු මස 18 වැනි දින දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 1 ද යන මායිම් තුළ පිහිටි ඉහත අංක 260/A/6 දරන පිඹුර අනුව අක්කර දෙකක් (අ. 02, රූ. 0, පර්. 0) විශාල ඉඩම සහ ඊට අයිති ගහකොළ පළතුරු ආදී සෑම සියලු දේත් සමග ය. මෙම දේපළ පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ P54/294 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජ සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

09-921

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 910236.
කුමාරවඩු තිලක් පුෂ්පකුමාර.

2013 ජූනි මස 28 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී :-

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එස්. විජේසේකර විසින් 2007 දෙසැම්බර් 13 වැනි දින සහිතක කරන ලද අංක 3086 හා 2011 ජූලි 12 දින සහතික කළ අංක 4014 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කුමාරවඩු තිලක් පුෂ්පකුමාර ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පනස් හතරලක්ෂ තිස්අටදහස් විසිඅටයි ශත හැටහතක (රු.5,438,028.67) ක මුදලක් 2013 අප්‍රේල් 30 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් පනස් හතරලක්ෂ තිස්අටදහස් විසිඅටයි ශත හැටහතක (රු.5,438,028.67) ක මුදල අය කර ගැනීම සඳහා සහ 2013 මැයි 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 4,803,519.70 ක මුදල මත 16% ක වැඩිදුර පොලියක් සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 3086 සහ 4014 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ දේපළ සහ පරිශ්‍ර කොළඹ 12 හල්ස්ඩෝෆ් වීදියේ අංක 182 දරන ස්ථානයේ 3 වන මහලේ පිහිටි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ

විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, කඩවත් සතර සහ බෝපේ පොද්දල ප්‍රාදේශීය සභා සීමාවේ, උලුවිටකේ හි පිහිටි බොකරමුල්ලේවත්ත එහි ඇති ගොඩනැගිලි ගහකොළ හා අනෙකුත් සියලු දේ සමග වන ඉඩම බෙදා වෙන්කොට 1991 ජුනි 12 දින බලයලත් මිනින්දෝරු ජී. එච්. ජී. ඒ. ඒ. ද සිල්වා විසින් මැන සාදන ලද අංක 1505 හි ලොට් අංක 6 (බලයලත් මිනින්දෝරු ටී. ජේ. අරඹේවෙල විසින් 1984 මැයි 13 වන දින සාදන ලද පිඹුරු අංක 106) ඉඩමට මායිම් වශයෙන් උතුරට : මෙම ඉඩමේම ඉතිරි කොටස ද, නැගෙනහිරට : ලොට් 7 මෙම ඉඩමට ඇති ප්‍රවේශ මාර්ගය ද, දකුණට : මෙම ඉඩමේම ලොට් 5 සහ බස්නාහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස පිඹුරු අංක 1505 අනුව විශාලත්වයෙන් පර්චස් දොලහක් (අ. 0, රූ. 0, පර්. 12) වේ. මෙය ගාල්ල දිස්ත්‍රික්කයේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A493/277 යටතේ ලියාපදිංචි වී ඇති අතර A493/70 සහ A444/32 ද සම්බන්ධ කර විමසා බැලිය යුතුවේ.

බලයලත් මිනින්දෝරු ජී. එච්. ජී. ඒ. ඒ. ද සිල්වා විසින් බොකරමුල්ලේවත්ත ඉඩම බෙදා වෙන්කොට සාදන ලද පිඹුරු 1505 හි ලොට් අංක 7 (බලයලත් මිනින්දෝරු ටී. ජේ. අරඹේවෙල විසින් 1984 මැයි 13 වන දින සාදන ලද පිඹුරු අංක 106) දරන ඉඩම කිසිම බාධාවකින්, අපහසුවකින් තොරව පරිහරණය කිරීමේ සහ එහි මතුපිටින් හෝ භූමිය යටින් විදුලිය කණු සිටුවීම, රැහැන් ඇදීම, ජලනල එලීම හෝ වෙනත් සම්බන්ධතා ස්ථාපනය කිරීමේ පූර්ණ අයිතිය සමග වූ මෙම ලොට් 7 ට මායිම් වශයෙන් උතුරට : මෙම ඉඩමේම ඉතිරි කොටස ද, නැගෙනහිරට : පවතින පාර ද, දකුණට : මෙම ඉඩමේම ඉතිරි කොටස සහ බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් 1, 2, 3, 4, 5 සහ 6 විශාලත්වයෙන් පිඹුරු අංක 1505 ට අනුව පර්චස් නමයක් (අ. 0, රූ, 0, පර්. 9) වූ මෙය ගාල්ල දිස්ත්‍රික්කයේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ 559/154 යටතේ ලියාපදිංචි වී ඇති අතර A444/291 සහ A444/32 ද සම්බන්ධ කර විමසා බැලිය යුතුවේ.

ආර්. ආර්. දූනුවිල මිය.,
සමාගම් ලේකම්.

09-919

---

### මහජන බැංකුව - කොල්ලුපිටිය සමුපාකාර ශාඛාව

#### 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013.01.24 දින පවත්වන ලද ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ :-

"මහජන බැංකුව වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. එන්. ප්‍රේමදාස මහතා විසින් සහතික කරන ලද 2010.08.31 දින අංක 127 දරන උකස් බැඳුම්කරය මත සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජී. කේ. එම්. මීගම මහත්මිය විසින් සහතික කරන ලද 2011.10.22 දින අංක 1809 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම කොඩිප්පිලි ආරච්චිගේ හර්ෂණ සංජීව ධර්මසිරි මහතා විසින් පැහැර හැර ඇති හෙයින්ද, එකී අංක 127 සහ 1809 දරන උකස් බැඳුම්කර මත දැනට මහජන බැංකුව වෙත පිළිවෙලින් රු. 1,427,743.49 (රුපියල් මිලියන එකයි හාර ලක්ෂ විසිහත් දහස් හත්සිය හතලිස් තුනයි ශත හතලිස් නවයක්) වූ මුදලක් සහ රු. 3, 380,408.92 (රුපියල් මිලියන තුනයි තුන්ලක්ෂ අසූදහස් හාරසිය අටයි ශත අනූ දෙකක් වූ) මුදලක් ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

අනතුරුව කිසියම් ගෙවීමක් සිදුකර (ඇත්නම්) එම මුදල අඩුකිරීමෙන් පසුව සහ වෙනත් විකුණුම් පිරිවැය සහ ගාස්තුද සමග රු. 1,427,743.49 (රුපියල් මිලියන එකයි හාර ලක්ෂ විසිහත් දහස් හත්සිය හතලිස් තුනයි ශත හතලිස් නවයක් වූ) මුදලක් මත 2012.07.31 දින සිට වෙන්දේසි දිනය දක්වා වර්ෂයකට 18% (සියයට දහඅටක් වූ) තවදුරටත් වූ පොලී මුදලක් ද රු. 3,380,408.92 (රුපියල් මිලියන තුනයි තුන් ලක්ෂ අසූ දහස් හාරසිය අටයි ශත අනූ දෙකක් වූ) මුදලක් මත 2012.07.20 වැනි දින සිට වෙන්දේසි දිනය දක්වා වර්ෂයකට 16% (සියයට දහසයක්) තවදුරටත් වූ පොලියද සමග පිළිවෙලින් එකී රු. 1,427,743.49 (රුපියල් මිලියන එකයි හාරලක්ෂ විසිහත් දහස් හත්සිය හතලිස් තුනයි ශත හතලිස් නවයක් වූ) මුදල සහ රු. 3,380,408.92 (රුපියල් මිලියන තුනයි තුන්ලක්ෂ අසූදහස් හාරසිය අටයි ශත අනූ දෙකක් වූ) මුදල අයකර ගැනීම සඳහා ඉහත කී අංක 127 සහ 1809 දරන උකස් බැඳුම්කර මත ඉහත කී මහජන බැංකුව වෙත උකස් කරන ලද දේපල සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර අර්වින් පෙරේරා මහතා මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබිය යුතුයැයි 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මතකර සිටිනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ මැද පත්තුවේ ගම්පහ ප්‍රාදේශීය සභා සීමාව තුල ගම්පහ අලුත්ගම ග්‍රාමයේ පිහිටා ඇත්තාවූ ද, "ඉදිගොල්ල ලන්ද" නමැති ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරුවන ඒ. ඒ. පී. ජයන්ත පෙරේරා මහතා විසින් සාදන ලද 2010.01.25 දින අංක 2321 දරන පිඹුරේ ලොට් අංක 2 ලෙස ලකුණුකර ඇත්තාවූ ද, දකුණට : මෙම ඉඩමේ ලොට් 1 සහ අංක 3065 දරන පිඹුරේ ලොට් A1 ද, නැගෙනහිරට : ඩබ්. ආරියපාල මහතා සහ කුමාර් වත්තගොඩ යන අයට අයත් ඉඩම් ද, දකුණට : ශාන්ත ජූඩ් පල්ලියට අයත් ඉඩම ද, බටහිරට : මෙහි ලොට් අංක 1 සහ ලොට් අංක 4 ද, යන මායිම් තුල පිහිටා ඇත්තා වූ ලොට් අංක 2 නමැති එකී බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ ඒ තුළ වූ ගොඩනැගිලි, ගහකොල, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ.

කලාප කළමණාකරු,
(කොළඹ දකුණ).

මහජන බැංකු ප්‍රධාන කලාප කාර්යාලය,
(බස්නාහිර කලාපය 01),
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

09-860

### ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2013 ජූලි 31 වැනි දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

"ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුනු ඩීඑෆ්සීසී බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න ලියා සහතික කළ අංක 1513 හා 2004 නොවැම්බර් මස 2 දින ද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න විසින් ලියා සහතික කළ අංක 1437 හා 2004 මැයි 21 දින ද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න විසින් ලියා සහතික කළ අංක 1407 හා 2004 මාර්තු 12 දින ද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ලකිත එස්. ජයසිංහ විසින් ලියා සහතික කළ අංක 122 හා 2002 දෙසැම්බර් මස 16 දින ද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ලකිත එස්. ජයසිංහ විසින් ලියා සහතික කළ අංක 121 හා 2002 දෙසැම්බර් මස 16 දින ද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න විසින් ලියා සහතික කළ අංක 1281 හා 2002 ජනවාරි මස 09 වැනි දින ද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න විසින් ලියා සහතික කළ අංක 1280 හා 2002 ජනවාරි මස 09 දින ද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න විසින් ලියා සහතික කළ අංක 1186 හා 2001 ජනවාරි මස 11 දින ද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න විසින් ලියා සහතික කළ අංක 1062 හා 2000 මාර්තු මස 07 වැනි දින ද, දරන සියලු උකස් බැඳුම්කර මත, අයවිය යුතු මුදල් ගෙවීම "නිහාල් ට්‍රේඩිං කොම්පනි" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස, ගල්කිස්ස, ගාලු පාර, අංක 194 දරන ස්ථානයේ ව්‍යාපාරය කරගෙන යන, කොළඹ 05, මුහන්දිරම් දාබරේ මාවත, අංක 32 දරන ස්ථානයේ, මුතුතන්ත්‍රිගේ නිහාල් සරත් පෙරේරා සහ කොළඹ 05, මුහන්දිරම් දාබරේ මාවත, අංක 32 දරන ස්ථානයේ අරුන්දතී ශ්‍රීදේවි ජයකොඩි පෙරේරා නොහොත් අරුන්දතී සීදේවි පෙරේරා *විවාහයට පෙර* ජයකොඩි යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

මුතුතන්ත්‍රිගේ නිහාල් සරත් පෙරේරා සහ අරුන්දතී ශ්‍රීදේවි ජයකොඩි පෙරේරා නොහොත් අරුන්දතී සීදේවි පෙරේරා *විවාහයට පෙර* ජයකොඩි යන අය ඩීඑෆ්සීසී බැංකුව වෙත කරන ලද ගෙවීමකින් අනතුරුව ඩීඑෆ්සීසී බැංකුව විසින්, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ලියනගේ ලියා සහතික කළ අංක 107 හා 2007 නොවැම්බර් මස 23 වැනි දින දරන නිදහස් කිරීමේ ඔප්පුව (Deed of Release) මගින් මෙහි දෙවැනි උපලේඛනයේ 1 වන කොටසේ සවිස්තරව විස්තර කර තිබෙන දේපළෙන්, මෙහි හතරවැනි හා පස්වැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර තිබෙන බිම් කොටස් දෙකක් මුදා හරින ලද හෙයින් ද,

2013 ජූනි 30 වැනි දිනට එකී මුතුතන්ත්‍රිගේ නිහාල් සරත් පෙරේරා සහ අරුන්දතී ශ්‍රීදේවි ජයකොඩි පෙරේරා නොහොත් අරුන්දතී සීදේවි පෙරේරා *විවාහයට පෙර* ජයකොඩි යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හාරකෝටි තිස්එක් ලක්ෂ හැත්තෑහතර දහස් අටසිය හතරකුත් ශත විසිනවයක (රු. 4,31,74,804.29) මුදලක් සහ 2013 ජූලි 01 දින පටන් විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දහනව ලක්ෂ දහසය දහස් හයසිය පණහක් (රු. 19,16,650.00) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද, රුපියල් මිලියන හතරක් (රු. 40,00,000) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි, ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) වර්ෂයකට සියයට අටකුත් දශම පහක් (8.5%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද, රුපියල් අසූපන් ලක්ෂයක් (රු. 85,00,000) සඳහා වර්ෂයකට සියයට විසිහතර (24%) බැගින් පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතු ව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් හාරකෝටි තිස්එක් ලක්ෂ හැත්තෑහතර දහස් අටසිය හතරකුත් ශත විසිනවයක (රු. 4,31,74,804.29) මුදල සහ 2013 ජූලි මස 01 වැනි දින පටන් විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දහනව ලක්ෂ දහසය දහස් හයසිය පනහක් (රු. 19,16,650.00) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද, රුපියල් මිලියන හතරක් (රු. 40,00,000) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) වර්ෂයකට සියයට අටකුත් දශම පහක් (8.5%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද, රුපියල් අසූපන් ලක්ෂයක් (රු. 85,00,000) සඳහා වර්ෂයකට සියයට විසිහතර (24%) බැගින් පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම් හා පරිශ්‍ර අතරින් මෙහි හතරවැනි හා පස්වැනි උපලේඛනවල විස්තර කර තිබෙන බිම් කොටස් අත්හැර එකී ඉඩම් හා පරිශ්‍ර හා ඒ මත පිහිටි සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර එකී අංක 1513, 1437, 1407, 122, 121, 1281, 1280, 1186 හා 1062 දරන උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 122, 1062, 1281 සහ 1186 දරන උකස් බැඳුම්කර මගින් අරුන්දතී ශ්‍රීදේවි ජයකොඩි පෙරේරා නොහොත් අරුන්දතී සීදේවි පෙරේරා *විවාහයට පෙර* ජයකොඩි යන අය විසින් ඩීඑෆ්සීසී බැංකුවට උකස් කර තිබෙන ඉඩම් හා පරිශ්‍ර අතරින්, මෙහි හතරවැනි හා පස්වැනි උපලේඛනවල විස්තර කර තිබෙන බිම් කොටස් අත්හැර, ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස්කර තිබෙන ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ ද ඉහත කී අංක 121 සහ 1280 යන උකස් බැඳුම්කර මගින් මුතුතන්ත්‍රිගේ නිහාල් සරත් පෙරේරා යන අය විසින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස්කර තිබෙන ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ ද අංක 1407, 1437 සහ 1513 යන උකස් බැඳුම්කර මගින් මුතුතන්ත්‍රිගේ නිහාල් සරත් පෙරේරා සහ අරුන්දතී ශ්‍රීදේවි ජයකොඩි පෙරේරා නොහොත් අරුන්දතී ශ්‍රීදේවි පෙරේරා *විවාහයට පෙර* ජයකොඩි යන අය විසින් ඩීඑෆ්සීසී බැංකුවට උකස් කර තිබෙන ඉඩමෙන් හා පරිශ්‍රයෙන් මෙහි හතරවැනි හා පස්වැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර තිබෙන බිම් කොටස් අත්හැර, එම ඉඩම හා පරිශ්‍රය ද, සහ එහි පිහිටි සියලු දේ ද කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින්

ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### පළමුවන උපලේඛනය

### අංක 1407, 1437, 1513, 121 සහ 1280 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා ප්‍රදේශ සීමාව ඇතුළත නාරාහේන්පිට පිහිටි, මුහන්දිරම් දාබරේ මාවත වරිපනම් අංක 32 සහ 32/1 දරන තුඩුවේවත්ත නොහොත් මහවත්ත නමැති ඉඩමේ, බලයලත් මානක එස්. වික්‍රමසිංහ මැන සකස් කළ අංක H/1291 හා 1984 මාර්තු 28 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 3 ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම් උතුරට : මුහන්දිරම් දාබරේ මාවත ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් අංක 2 ද, දකුණට : මෙම ඉඩමේ ලොට් අංක 1 ද, බස්නාහිරට : ලොට් අංක 4 (පාර සඳහා වෙන්කළ බිම) ද යන මායිම් ඇතුළත එකී අංක H/1291 දරන පිඹුර ප්‍රකාර පර්චස් හයකුත් දශම අටක් (අ. 0, රූ. 0, පර්. 6.8) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1557/84 යටතේ ලියාපදිංචි කර තිබේ.

මෙයට මෙහි පහත විස්තර කරන බිම් කොටස තුළින්, මතින් සහ ඔස්සේ මාර්ග අයිතිය ද ඇතුළත් වේ.

ඉහත කී නාරාහේන්පිට පිහිටි තුඩුවේවත්ත නොහොත් මහවත්ත නමැති ඉඩමේ ඉහත සඳහන් H/1291 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 4 ලකුණු කළ (අඩි 12ක් පළල) බෙදාවෙන් කළ බිම් කට්ටිය වූ උතුරට : මුහන්දිරම් දාබරේ මාවත ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් අංක 3 ද, දකුණට : මෙම ඉඩමේ ලොට් අංක 1 ද, බස්නාහිරට : රොටරි සංගමයේ ඉඩම ද, යන මායිම් ඇතුළත එකී අංක H/1291 දරන පිඹුර ප්‍රකාර පර්චස් දෙකකුත් දශම අටක් (අ. 0 රූ. 0 පර්. 2.8) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම වේ. මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 1557/84 ලියාපදිංචි කර තිබේ.

### දෙවන උපලේඛනය

### අංක 1407, 1437, 1513, 122, 1062, 1281 හා 1186 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය

*1 වැනි කොටස*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ආදායම් පාලක නිලධාරී කොට්ඨාසයේ, යටිගහ පත්තුව, සුළු කොට්ඨාසයේ (Minor Division) කොටදෙනියාව ග්‍රාමයේ පිහිටි "ගල්ඉඹුර" නමැති ඉඩමේ බලයලත් මානක ඩබ්ලිව්. විතාරණ මැන සකස් කළ අංක 2345 සහ 1995 මාර්තු මස 09 වනි දින දරන පිඹුරේ ලොට් අංක 1ඒ2 ලකුණු කළ බිම් කට්ටියක් වූ බෙදා වෙන්කළ බිම් කට්ටියට මායිම්, උතුරට : ඇළ, සිරිසේනට සහ තවත් අයට අයිති පොඩිකන්ද සහ ඉහත කී අංක 2345 දරන පිඹුරේ ලොට් 1ඒ3 ද, නැගෙනහිරට : ග්වෙන්ඩලින් ජයකොඩිට අයිති අක්කර 20 ද, දකුණට : ග්වෙන්ඩලින් ජයකොඩිට අයිති අක්කර 20, සහ කලින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයිතිව තිබුණු දැනට ඒ. එස්. පෙරේරා මහත්මියට අයිති ඉඩම ද, බස්නාහිරට : ආර්. ඩබ්ලිව්. දිගේනිස්ට සහ තවත් අයට අයිති පොඩිකන්ද ද යන මායිම් ඇතුළත අක්කර විස්සකුත් රූඩ් තුනකුත් පර්චස් විසිතුනයි දශම පහයි හතරක් (අ. 20, රූ. 3, පර්. 23.54) බිම් ප්‍රමාණයෙන් යුත් මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී263/241 යටතේ ලියාපදිංචි ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ වැවිලි ද වේ.

මෙයට ඉහත සඳහන් අංක 2345 දරන පිඹුරේ ලොට් 1B1 හා ලොට් 1A1 ලකුණු කළ හා පිළිවෙලින් රූඩ් එකකුත් පර්චස් දොළහයි දශම පහයි නවයක් (අ. 0 රූ. 1 පර්. 12.59) සහ පර්චස් දහසයයි දශම හතයි හයක් (අ. 0 රූ. 0 පර්. 16.76) බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කොටස් මතින් මාර්ග අයිතිය ද ඇතුළත් වේ.

*2 වැනි කොටස*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ආදායම් පාලක නිලධාරී කොට්ඨාසයේ, යටිගහ පත්තුව, සුළු කොට්ඨාසයේ (Minor Division) කොටදෙනියාව ග්‍රාමයේ පිහිටි "ගල්ඉඹුර" නමැති ඉඩමේ ඉහත කී අංක 2345 දරන පිඹුරේ ලොට් 1බී 2 ලකුණු කළ බිම් කට්ටිය වූ උතුරට : රෝහිණී සූරියආරච්චිට අයිති ගල්ඉඹුරේවත්ත සහ එස්. ජේ. වල්පිට සහ සමාගමට අයිති දිසානායකවත්ත ද, නැගෙනහිරට : රජයට් අයත් දියගම්පොළ කොළනිය ද, දකුණට : ඉහත කී අංක 2345 පිඹුරේ ලොට් 1 බී 3 ද, බස්නාහිරට : එකී අංක 2345 පිඹුරේ ලොට් 1 බී 1 ද යන මායිම් ඇතුළත අක්කර හයකුත් රූඩ් එකකුත් පර්චස් විසිහතරයි දශම හයයි හතරක් (අ. 6, රූ. 1, පර්. 24.64) බිම් ප්‍රමාණයෙන් යුත් සහ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 228/382 යටතේ ලියාපදිංචි ඉඩම හා එහි පිහිටි ගොඩනැගිලි සහ වැවිලි ද වේ.

මෙයට ඉහත සඳහන් අංක 2345 දරන පිඹුරේ ලොට් 1B1 ලෙස විස්තර කරන රූඩ් එකකුත් පර්චස් දොළහයි දශම පහයි නවයක් (අ. 0 රූ. 1 පර්. 12.59) බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කොටස මතින් මාර්ග අයිතිය ද ඇතුළත් වේ.

### තුන්වන උපලේඛනය

### අංක 1407, 1437, 1513, 122 හා 1281 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, හාපිටිගම් කෝරළේ, යටිගහපත්තුවේ, ගල්ඉඹුරේ පිහිටි "ගල්ඉඹුර එස්ටේට්" නමැති ඉඩමේ, බලයලත් මානක ඩබ්ලිව්. විතාරණ මැන සකස් කළ අංක 1770 හා 1993 සැප්තැම්බර් මස 05 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 2 ලකුණු කළ බිම් කට්ටිය වූ උතුරට : ග්වෙන්ඩොලින් ජයකොඩි හිමිකම් කියන අක්කර විස්ස නොහොත් මහකන්ද නැමති ඉඩමේ ලොට් අංක 1 ද, නැගෙනහිරට : ග්වෙන්ඩොලින් ජයකොඩි හිමිකම් කියන අක්කර විස්ස නොහොත් මහකන්ද ද රජයට අයිති මහකන්ද සහ පළාත් සභා පාර ද, දකුණට : පළාත් සභා පාර ද, බස්නාහිරට : ලෝලුවාගොඩ ජයවර්ධන වෙද මහත්මයාගේ උරුමකරුවන් හිමිකම් කියන ගනේකන්ද සහ චූටි මහත්තයා හිමිකම් කියන ඉඩම ද, යන මායිම් ඇතුළත අංක 1770 දරන පිඹුර ප්‍රකාර අක්කර දොළහකුත් රූඩ් දෙකකුත් පර්චස් දහනවයයි දශම නවයක් (අ. 12 රූ. 2 පර්. 19.9) බිම් ප්‍රමාණයෙන් යුත් සහ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 269/133 යටතේ ලියාපදිංචි ඉඩම වේ.

### හතරවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරළේ, යටිගහපත්තුවේ, මීරිගම ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත ගල්ඉඹුර ග්‍රාමයේ පිහිටි "ගල්ඉඹුර" නොහොත් "ගල්ඉඹුරේවත්ත" යනුවෙන් හැඳින්වෙන හා ප්‍රකට ඉඩමේ, බලයලත් මානක අයි. කොටඹගේ මැන සකස් කළ අංක 8087 හා 2006 අප්‍රේල් මස 08 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වූ උතුරට : මෙම

ඉඩමේ අංක 1770 දරන පිඹුරේ ලොට් අංක 1 හි ඉතිරි කොටස ද, නැගෙනහිරට : මෙම ඉඩමේ අංක 1770 දරන පිඹුරේ ලොට් අංක 1 හි ඉතිරි කොටස ද, දකුණට : මෙම ඉඩමේ අංක 1770 දරන පිඹුරේ ලොට් අංක 1 හි ඉතිරි කොටස ද, බස්නාහිරට : (පළාත් සභා) පාර ද යන මායිම් ඇතුළත එකී අංක 8087 දරන පිඹුර ප්‍රකාර අක්කර දෙකකුත් රූඩ් දෙකක් (අ. 2 රූ. 2 පර්. 0) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි හා ඊට අනුබද්ධ සියලු දේ.

### පස්වන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, හාපිටිගම් කෝරළේ, යටිගහපත්තුවේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය ඇතුළත කොටදෙනියාව ග්‍රාමයේ පිහිටි ගල්ඉඹුරේවත්ත යනුවෙන් හැඳින්වෙන හා ප්‍රකට ඉඩමේ, බලයලත් මානක ඩබ්ලිව්. විතාරණ මැන සකස් කළ අංක 5485 හා 2007 ජුනි 27 දින දරන සහ 2007 නොවැම්බර් 14 වැනි දින දී පිටසන් කළ පිඹුරේ නිරූපිත ලොට් අංක 1 ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටියට එකී පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : ජී. ආර්. එස්. ජයලත් හිමිකම් කියන මෙම ඉඩමේ කොටසක් සහ මෙම ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ පාර ද, බස්නාහිරට පාර සහ ජී. ආර්. එස්. ජයලත් හිමිකම් කියන මෙම ඉඩමේ කොටසක් ද යන මායිම් ඇතුළත ඉහත කී අංක 5485 දරන පිඹුර ප්‍රකාර අක්කර පහකුත් පර්චස් පහයි දශම අටයි බිංදුවක් (අ. 5 රූ. 0 පර්. 5.80) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි හා ඊට අනුබද්ධ සියලු දේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

09-567

---

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2013.08.13 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් බී, බී. රණසිංහ විසින් සහතික කරන ලද 2012.05.02 වැනි දිනැති අංක 6860 දරන උකස් බැඳුම්කරය අනුව 2013.07.19 වැනි දින තෙක් මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් එක්කෝටි අසූතුන් ලක්ෂ හතලිස් දහස් එකසිය හැට අටයි ශත දාහතක (රු. 18,340,168.17) මුදල සමග රුපියල් එක්කෝටි හැටඅට ලක්ෂ දාහතර දහස් නවසිය හතලිස් නවයයි ශත එකොළහක (රු. 16,814,949.11) මුදල මත වසරකට සියයට පහළොව (15%) බැගින් පොළියක් 2013.07.20 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් බත්තරමුල්ල. පැලවත්ත, පෙරේරා ගාඩ්න්ස් අංක 30/15B හි සන්වෝ ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙතින් අයවිය යුතුව ඇත. (මද්දුම පටබැඳිගේ චමින්ද නන්ද කුමාර මහතා සහ තුෂාරි කස්තූරිආරච්චි මද්දුම පටබැඳි මහත්මිය අධ්‍යක්ෂවරු වෙති).

2. ප්‍රසිද්ධ නොතාරිස් බී බී. රණසිංහ විසින් සහතික කරන ලද හා 2012.05.02 වැනි දිනැති එකී අංක 6860 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් එක්කෝටි අසූතුන් ලක්ෂ හතලිස් දහස් එකසිය හැට අටයි ශත දාහතක (රු. 18,340,168.17) මුදල සමග 2013.07.20 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවතේ අංක 50/3හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස්හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, බොරැල්ල අධිශ්‍රේණි ශාඛාවේ කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### ඉහත සඳහන් උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ, පහළ බෝමිරිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පහළ බෝමිරියේ ලැනරෝල් මාවතේ වරිපනම් අංක 46/2 දරන දෙවැට ඕවිට නමැති ඉඩමට එහි ඇති පස්, ගහකොළ සහ සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු එල්. ආර්. ජයසුන්දර (එහෙත් එස්. රාමක්‍රිෂ්ණන් ලෙස ලියාපදිංචිව ඇත) විසින් වඩාත් නිවැරදිව සාදන ලද 2003.09.30 දිනැති අංක 2375B දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2, උතුරට : ලොට් 1 ද, නැගෙනහිරට : ලොට් 1 සහ මීටර් 6.0 පළල පාර ද, දකුණට : පාර ද, බස්නාහිරට : ලොට් 2 සහ අකුරු ඇල ද මායිම්ව අක්කර එකක (අ. 1, රූ. 0, පර්. 0) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1900/169හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. එම්. ආර්. ඩී. සුබසිංහ,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
බොරැල්ල.

09-708

---

පීවී 20296.

### 2007 අංක 07 දරන සමාගම් පනත

394 (3) වගන්තිය යටතේ "හීරෝ එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2004.10.04 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "හීරෝ එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "හීරෝ එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (*රාජකාරි ඉටුකිරීම*) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2013 අගෝස්තු මස 30 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

09 - 923

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2013.08.13 වෙනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් බී. බී. රණසිංහ විසින් සහතික කරන ලද 2011.10.17 දිනැති අංක 6547 සහ 2011.12.22 දිනැති අංක 6693 දරන උකස් බැඳුම්කර අනුව 2013.07.12 දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් පනස් ලක්ෂ හැට හතර දහස් එකසිය හැට හතරයි ශත දහතුනක (රු. 5,064,164.13) මුදල සමග රුපියල් හතලිස් අට ලක්ෂ විසි අට දහස් පන්සිය දහතුනයි ශත විසි තුනක (රු.4,828,513.23) මුදල මත වසරකට සියයට දහනවයයි දශම පහයි බිංදුව (19.50%) බැගින් පොලියක් 2013.07.13 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් බොරැල්ල ලක්ෂ්මි ගාඩින්ස්, අංක 02, 2/1 හි ඒ. සී. ඊ. ඉන්ටනැෂනල් රෙකෲට්මන්ට් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙතින් අයවිය යුතුව ඇත. කෝට්ටේ, කෝට්ටේ පාර වීරසිංහ ගාඩින් හි අංක 540/12 හි පදිංචි ඇන්ටන් ඇල්බර්ට් ඉන්ද්‍රජිත් ජෝශප් ඉෂාම් යූසුප් මහතා, ජෝශප් අහමඩ් මුෂින් යූසුප් මහතා සහ රොෂාන් යූසුප් (විවාහයට පෙර හසන්) මහත්මිය අධ්‍යක්ෂවරු වෙති.

2. ප්‍රසිද්ධ නොතාරිස් බී. බී. රණසිංහ විසින් සහතික කරන ලද හා 2011.10.17 දිනැති එකී අංක 6547 සහ 2011.12.22 දිනැති අංක 6693 දරන එකී උකස් බැඳුම්කර මත අයවිය යුතු රුපියල් පනස් ලක්ෂ හැට හතර දහස් එකසිය හැට හතරයි ශත දහතුනක (රු. 5,064,164.13) මුදල සමග 2013.07.13 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥා පනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවතේ අංක 50/3 හි ටී. ඇන්ඩ් එච් ඔක්ෂන්ස්හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, බොරැල්ල අධි ශ්‍රේණි ශාඛාවේ කළමනාකරු හටද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, සියනෑ කෝරලය තුල, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ, මාකොළ දකුණ පිහිටි වරිපනම් අංක 89 දරන දවටගහලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් සාදන ලද 1963 දෙසැම්බර් 8 දිනැති අංක 872 දරන පිඹුරෙහි ලොට් D ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් D උතුරට : බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් සාදන ලද 1963 පෙබරවාරි 27 දිනැති අංක 860 දරන පිඹුරෙහි ලොට් 1 ද, නැගෙනහිරට සහ දකුණට : අංක 860 දරන එකී පිඹුරෙහි ලොට් 11 (පාරට වෙන්කළ කොටස) ද, බස්නාහිරට : එකී අංක 872 දරන පිඹුරෙහි ලොට් E සහ H ද මායිම්ව එහි ඇති ගහ කොළ ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද ඇතුළත්ව එකී අංක 860 දරන පිඹුරට අනුව පර්චස් තිහයි දශම පහක (අ. 0, රූ.0, පර්. 30.5) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C660/300 හි ලියාපදිංචි කර ඇත.

එකී මාකොළ පිහිටි දවටගහලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් සාදන ලද 1963 පෙබරවාරි 27 දිනැති අංක 860 දරන පිඹුරෙහි ලොට් 11 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 11 උතුරට : එකී අංක 860 දරන පිඹුරෙහි ලොට් 12 සහ 10 සහ ප්‍ර. වැ. දෙ පාර ද, නැගෙනහිරට : එකී අංක 860 දරන පිඹුරෙහි ලොට් 2, 4, 5 සහ 6 ද, දකුණට : එකී අංක 860 දරන පිඹුරෙහි ලොට් 6, 7, 8 සහ 9 ද, බස්නාහිරට : එකී අංක 860 දරන පිඹුරෙහි ලොට් 1, 12, 9 සහ 10 ද මායිම්ව එකී අංක 860 දරන පිඹුර අනුව පර්චස් තිහක (අ. 0, රූ. 0, පර්. 30) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C103/53 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය අණ පරිදි,

ඒ. එම්. ආර්. ඩී. සුබසිංහ,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
බොරැල්ල අධිශ්‍රේණි ශාඛාව,

09-707

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.